# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# වර්ෂ අවසාන ඇගයීම - 2001
# ගණිතය

**6 ශ්‍රේණිය**

නම: ........................................................................................................ කාලය: පැය 02 යි

## I කොටස

◆ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයෙහිම පිළිතුරු ලිවිය යුතුය)

01. ඉදිරියේ ඇති රූපයෙහි
මුළු ත්‍රිකෝණ ගණන කීයද? ............................



( 1 රූපය)

02. 385 යන සංඛ්‍යාවේ 3 ඉලක්කමින් නිරූපණය වන අගය කවරේද ? ........................................

03. කාසියක් උඩ දැමූ විට ලැබෙන ප්‍රතිඵල ලියා දක්වන්න ..................................................

04. 5 082 165 යන සංඛ්‍යාවේ දහස් කලාපය කුමක් ද? ..................................................

05. 28 හි සාධක දෙකක් ලියන්න ..................................................................................

◆ 6 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස් තැනට ගැලපෙන සංඛ්‍යාව හෝ පදය වරහන් තුළින් තෝරා ලියන්න.

06. ................ $>$ 10 (5, 0, 12)

07. කෙසෙල් පිති කැබැල්ලක වක්‍ර පෘෂ්ඨ කොටස් ................. ක් ඇත (3, 4, 2)

08. වෘත්තයක් සමාන කොටස් දෙකකට වෙන් වන සේ නැමිය හැකි නැවුම් දාර .................. වේ.
(දෙක, හතර, බොහෝ)

09. ඔබේ පංති කාමරයේ මුල්ලක බිත්ති දෙක හමුවන දාරය .................. දාරයකි (තිරස් / සිරස්)

10. 53☐
ඉහත දැක්වෙනුයේ ඉලක්කම් තුනක සංඛ්‍යාවකි. එම සංඛ්‍යාව දෙකෙන් ඉතිරි නැතිව බෙදිය හැකි වීමට සුදුසු ඉලක්කම හිස් කොටුවට යොදන්න. (3, 7, 0)

11. තේ හැන්දකට අල්ලන මිලිලීටර ප්‍රමාණය ආසන්න වශයෙන් ................ කි.

12. $\frac{3}{5} = \frac{9}{\square}$ වන පරිදි හිස් කොටුව පුරවන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

13. සීනි 500g කින් තේ කෝප්ප 30 ක් සෑදිය හැක. 75 දෙනෙකු සඳහා වූ සංග්‍රහයකට අවශ්‍ය සීනි ප්‍රමාණය නිමානය කර ලියා දක්වන්න. ............................

14. 4, 9, 6 යන ඉලක්කම් තුන ම භාවිත කර ලිවිය හැකි විශාලතම ඔත්තේ සංඛ්‍යාව ලියන්න.
............................................

15. පොතක දිග 23.5cm වේ. තවත් පොතක දිග 27.7 cm කි. පොත් දෙක ම එක දිගට සිටින සේ තැබූ විට මුළු දිග .................cm කි.

16. ගුවන් විදුලි වැඩ සටහනක් ආරම්භ වූ වේලාව පෙ.ව. 10 පසු වී මිනිත්තු 8 තත්පර 12 මෙම වේලාව පැය 24 ඔරලෝසුවෙන් ලියා දක්වන්න.

17. $81 = \square^4$

ඉහත හිස්කොටුවට ගැලපෙන සංඛ්‍යාව ලියන්න.

18. 1 m හා 10 cm අතර අනුපාතය සරල ම ආකාරයෙන් ලියා දක්වන්න.

19. රූපයේ P ට හෝ Q ට අයත් නොවන 10 ට අඩු සංඛ්‍යා දෙකක් ලියන්න.




20. $y + 7 = 20$ යන සම්බන්ධය සත්‍යවන පරිදි y සඳහා ආදේශ කළ යුතු සංඛ්‍යාව ලියන්න.

## II කොටස
**(වෙන ම කඩදාසියක පිළිතුරු සපයන්න)**

◆ **ප්‍රශ්න 6 කට පමණක් පිළිතුර සපයන්න.**

01. වෙළෙන්දෙක් සීනි 5.25 kg ක ප්‍රමාණයක් මිලට ගන්නේය. එම ප්‍රමාණය.
(අ) (i) kg වලින් සහ g වලින් දක්වන්න
(ii) g වලින් පමණක් දක්වන්න.
(ආ) ඔහු එම සීනි ප්‍රමාණය 500g බැගින් පැකැට්ටු සෑදුවේය.
(i) සෑදූ 500g පැකැට්ටු ගණන සොයන්න.
(ii) ඉතිරිවූ සීනි ප්‍රමාණය g වලින් දක්වන්න.
(ඇ) 1 625 ml ප්‍රමාණය l වලින් පමණක් දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

02. (අ) 13 + 1, 13 + 2, 13 +3, ................ යන රටාවේ 4 වැනි පදය 13 + 4 වේ. ඒ අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(i) 7 වැනි පදය ලියන්න.
(ii) 13 + 10 යනු එම රටාවේ කවර පදය ද?
(iii) P වැනි පදය දැක්වීමට P අඩංගු ප්‍රකාශනයක් ලියන්න.

(ආ) විස්කෝත්තු පැකට් කීපයක වෙන වෙනම තිබූ විස්කෝත්තු සංඛ්‍යා පහත දැක්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 20 | 18 | 19 | 21 | 20 | 19 | 18 | 20 |
| 21 | 20 | 22 | 20 | 21 | 19 | 20 | 20 |
| 19 | 19 | 22 | 21 | 20 | 20 | 18 | 19 |

පහත වගුව පිටපත් කරගෙන ඉහත තොරතුරු ඇසුරෙන් එය සම්පූර්ණ කරන්න.

| පැකට් එකක ඇති විස්කෝතු ගණන | ප්‍රගණන ලකුණු | පැකට් ගණන |
|---|---|---|
| 18 | ............ | ............ |
| 19 | ............ | ............ |
| 20 | ............ | ............ |
| 21 | ............ | ............ |
| 22 | ............ | ............ |

03. (අ) මෙම යන්ත්‍රය තුළට එක් එක් සංඛ්‍යාව ඇතුළු කළ විට කිසියම් ක්‍රියාවක් සිදු වී වෙනත් සංඛ්‍යාවක් බැගින් පිටතට එයි. එම ක්‍රියාවට අනුව පහත වගුවේ හිස් තැන් පුරවන්න..




| ඇතුළු කළ සංඛ්‍යාව | පිට වූ සංඛ්‍යාව |
|---|---|
| 4 | 7 |
| 7 | ............... |
| ............... | 12 |
| ............... | 18 |
| 25 | ............... |
| n | ............... |

(ආ) පහත "A" කොටසෙහි දැක්වෙන එක් එක් මිශ්‍ර සංඛ්‍යාවට හෝ විෂම භාගයට ගැලපෙන සංඛ්‍යාව "B" කොටසින් තෝරා ඊ සලකුණකින් යා කරන්න.

| A | B |
|---|---|
| $2\frac{1}{5}$ | $\frac{13}{8}$ |
| $1\frac{5}{8}$ | $\frac{11}{5}$ |
| $\frac{7}{2}$ | $\frac{9}{2}$ |
| $\frac{15}{2}$ | $3\frac{1}{2}$ |
| $4\frac{1}{2}$ | $7\frac{1}{2}$ |

04.




සිසුන් හතර දෙනෙකුගේ වයස් අවුරුදුවලින් සංඛ්‍යා රේඛාව මත දක්වා ඇත. එය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) සිසුන් හතර දෙනාගේ වයස් වෙන වෙන ම ලියන්න.

(ii) බාලම තැනැත්තා කවරෙක් ද?

(iii) වැඩිමහල් තැනැත්තා කවරෙක් ද? ඔහුගේ වයසත් බාලම තැනැත්තාගේ වයසත් අතර වෙනස සොයන්න.

(iv) අවුරුදු 15 ට වැඩි වයස් අයගේ නම් ලියන්න.

(v) නිමල්ගේ වයසට වඩාත් කිට්ටු වන්නේ හෂාන්ගේ වයස ද? ඩිෂාන්ගේ වයස ද? හේතු දක්වන්න.

05. (අ)




To download past papers visit www.vajirapani.blogspot.com

ගිනිකූරුවලින් සෑදූ රූප රටා කීපයක් ඉහත දක්වා ඇත. එහි (a), (b) සහ (c) රූප රටා අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) (b) රූප රටාව සෑදීමට ගෙන ඇති මුළු ගිනිකූරු ගණන කීය ද?

(ආ) පාදයක දිග ගිනිකූරු 4 ක් වන සේ ඉහත ආකාරයේ රූප රටාවක් සෑදීමට ගත යුතු මුළු ගිනිකූරු ගනන කිය ද?
එම රූප රටාව ඔබේ පිළිතුරු පතෙහි අඳින්න.

(ඉ) සුදත් සෑදූ මෙම ආකාරයේ රූප රටාවක මුළු ගිනිකූරු ගණන 30 ක් විය. එම රූප රටාවේ පාදයක ගිනිකූරු කීයක් තිබුණේ ද?

(ඊ) සුළු කරන්න.

$$\begin{array}{r} 10\,.\,758 \\ -\ 6\,.\,49 \\ \hline \end{array}$$

06. (අ) (i) රූපයේ දැක්වෙන් 108 හි ප්‍රථමක සාධක පෙන්වන සාධක ගසකි. එහි ඇති හිස් කොටු සහ රවුම් පුරවන්න

(ii) 108 හි ප්‍රථමක සාධක තිත් ඉරිමත ලියන්න?




= ............x............x...........x............x............

(ආ) හිස් කොටු පුරවන්න.

$$\begin{array}{r} \square\ 4\ \square \\ +\ 3\ \square\ 1 \\ \hline 9\ 7\ 8 \\ \hline\hline \end{array}$$

07.




(අ) මිනිත්තු 40 ක් තුළ පාසල පසුකර ගිය කාර් 25 ක පාට සටහන් කරගෙන ෂාන් අඳින ලද ප්‍රස්තාරය රූපයේ දැක්වේ. ඒ අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) වැඩියෙන්ම පාසල පසුකර ගිය කාර්වල පාට කුමක් ද?

(ii) ප්‍රස්තාරයට අනුව සමාන කාර් සංඛ්‍යාවක් දැක්වෙන පාට තිබේ ද? එසේ නම් ඒවායේ පාට කුමක් ද?

(iii) අඩුම සංඛ්‍යාවක් දැක්වූයේ කුමන පාටින් යුත් කාර් ද?

(iv) කළු පාට කාර් සංඛ්‍යාවත්, දුඹුරු පාට කාර් සංඛ්‍යාවත් අතර වෙනස සොයන්න.

(ආ) 1001 සංඛ්‍යාව 10 න් බෙදූ විට

(i) ලබ්ධිය ලියන්න

(ii) ශේෂය (ඉතිරිය) ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

08. (අ) ◆ පහත රූපවල දැක්වෙන x සහ y අගය මගින් දැක්වෙන අගය දෙවන තීරුවේ ලියන්න.

◆ පරිමිතිය සොයන අකාරය සහ එහි අගය තුන්වන තීරුවේ ලියන්න.

| | රූපය | සංකේත මගින් දැක්වෙන අගය | පරිමිතය සොයන ආකාරය සහ එහි අගය |
|---|---|---|---|
| (i) |  | Y= .............cm. | පරිමිතිය ......................... ......................................... =.........................cm |
| (ii) |  | X= .............cm. | පරිමිතිය ......................... ......................................... =.........................cm |

(ආ)




දිග 8m වූ සහ පළල 6 m වූ සෘජුකෝණාස්‍රයක රූපයක් ඉහත දැක්වේ. එය සමාන කොටස් 4 කට වෙන් කර ඇත. රූපය ඇසුරෙන්

(i) මුළු රූපයේ වර්ගඵලය

(ii) අඳුරු කළ කොටසෙහි වර්ග ඵලය සොයන්න.

# 2001 ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර
## 6 ශ්‍රේණිය

**I කොටස**

| | | | | |
|---|---|---|---|---|
| **(1)** 5 | **(2)** 300 | **(3)** සිරස හෝ අගය | **(4)** 082 | **(5)** 1,2, 4,7,14,28 (ඕනෑම දෙකක්) |
| **(6)** 12 | **(7)** 2 | **(8)** බොහෝ | **(9)** සිරස් | **(10)** [0] |
| **(11)** 5 ml | **(12)** [15] | **(13)** 1 kg 250g | **(14)** 649 | **(15)** 51.2cm |
| **(16)** 100812 h | **(17)** [3] | **(18)** 10 : 1 | **(19)** 2, 6, 8 (ඕනෑම දෙකක්) | **(20)** 13 |

**II කොටස**

**(1)** (අ) **(i)** 5kg 250g **(ii)** 5250g

(ආ) **(i)** 10 **(ii)** 250g

(ඉ) 1.625 l

**(2)** (අ) (i) 13 + 7 **(ii)** 10වන පදය **(iii)** 13 + P

(ආ)

| විස්කෝතු ගණන | ප්‍රගණන ලකුණු | පැකට් ගණන |
|---|---|---|
| 18 | \|\|\| | 3 |
| 19 | 卌 \| | 6 |
| 20 | 卌 \|\|\|\| | 9 |
| 21 | \|\|\|\| | 4 |
| 22 | \|\| | 2 |
| | | 24 |

(3) (අ)

| ඇතුල් කළ සංඛ්‍යාව | පිටවූ සංඛ්‍යාව |
|---|---|
| 4 | 7 |
| 7 | 10 |
| 9 | 12 |
| 15 | 18 |
| 25 | 28 |
| n | n + 3 |

(ආ)

| A | B |
|---|---|
| $2\frac{1}{5}$ → | $\frac{11}{5}$ |
| $1\frac{5}{8}$ → | $\frac{13}{8}$ |
| $\frac{7}{2}$ → | $3\frac{1}{2}$ |
| $\frac{15}{2}$ → | $7\frac{1}{2}$ |
| $4\frac{1}{2}$ → | $\frac{9}{2}$ |

(4) (i)

| තිලක්, | හෂාන්, | නිමල්, | ඩිෂාන් |
|---|---|---|---|
| 9, | 12, | 16, | 18 |

අවුරුදු

(ii) තිලක් (iii) ඩිෂාන්, අවු. 9 යි

(iv) නිමල්, ඩිෂාන් (v) ඩිෂාන් (වෙනස අඩු නිසා)

(5) (අ) 6 (ආ) 12

(ඉ) 10 (ඊ) 4.268



(6) (අ)




(ආ)

$$\begin{array}{r} \boxed{6}\ 4\ \boxed{7} \\ +\ 3\ \boxed{3}\ 1 \\ \hline 9\ 7\ 8 \end{array}$$

(7) (අ) (i) කළු (ii) ඔව් - නිල් සහ සුදු (iii) කොළ (iv) 6

(ආ) (i) 100 (ii) 1

(8) (අ) (i) Y = 8cm —— පරිමිතිය (2.5 + 2 + 3 + 2 + 2.5 + 1 + 8 + 1) = 22cm

X = 10cm —— පරිමිතිය (5 + 5 + 5 + 10 + 5)) = 30cm

(ආ) (i) 48 $m^2$ (ii) 12 $m^2$